සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

පළමු වාර පරීක්ෂණය 2019 මාර්තු
First Term Test, March 2019

11 ශ්‍රේණිය
Grade 11

නර්තනය - I

පැය එකකි
One hour

සැලකිය යුතුයි :

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- සියලුම අයදුම්කරුවන් I කොටසේ ප්‍රශ්න 30 ටම පිළිතුරු සැපයිය යුතුය. එයට අමතරව II - උඩරට නර්තනය හෝ III - පහතරට නර්තනය හෝ IV - සබරගමු නර්තනය යන කොටස් තුනෙන් එක් කොටසකට පමණක් පිළිතුරු සැපයිය යුතුය.

## I කොටස

01. අතීතයේ පැවති සටන්ක්‍රම ඇසුරෙන් නිර්මාණය වූ ගැමි නැටුම් විශේෂයකි.
(1) පතුරු (2) කුළු මෝල්ගස්
(3) කඩු සරඹ (4) රබන්

02. $\hat{1}\,2\ /\ \hat{1}\,2\ /\ \acute{1}\,2\,3\,4$ තාලරූපය .......... යනුවෙන් හැඳින්වේ.
(1) සුළු මහ දෙතිත (2) මැදුම් මහ දෙතිත
(3) දෙසුළු මැදුම් තුන් තිත (4) දෙසුළු මහ තුන් තිත

03. අවකාශ භාවිතයේ ඉතා වැදගත් සංකල්පයකි.
(1) විදුලි ආලෝක (2) වාදන හා සැරසිලි
(3) තල හා දිසා (4) රංග වස්ත්‍රාභරණ

04. ඇස් අඩවන් වීම, එක් ඉරියව්වක සිටීම හා සංයමය වන මූලික භාවමය ලක්ෂණ ප්‍රදර්ශනය වනුයේ
(1) ශාන්ත රසයේදී ය. (2) වීර රසයේදී ය. (3) භීබත්සා රසයේදී ය. (4) හාස්‍ය රසයේදී ය.

05. නාට්‍ය රත්නාකරය නම් කෘතිය රචනා කරන ලද්දේ,
(1) මහාචාර්ය ගුණපාල මලලසේකර මයා (2) ජේ. ඊ. සේදරමන් මහතා
(3) රවීන්ද්‍රනාත් තාගෝර් මහතා (4) එදිරිවීර සරච්චන්ද්‍ර මහතා

06. සාම්ප්‍රදායික වන්නම් වලට අමතරව පසු කාලීනව නිර්මාණය කරන ලද වන්නම් නොවන්නේ,
(1) මහබෝ සහ හංස. (2) හංස සහ මරගන
(3) මරඟන සහ සමනළ. (4) කරදිය සහ දෙපානෝ

07. ශාන්තිකර්මයන් හි අන්තර්ගත අටමගලේ කවි ඇසුරෙන් නිර්මාණය කළ ගැමි නැටුම වන්නේ,
(1) චාමර (2) මෝල්ගස් (3) කලගෙඩි (4) සවරං

08. 2+2+3 තිත් ප්‍රභේදය සඳහා තාලම්පටින් ආඝාතය තැබිය යුතු වන්නේ,
(1) තිත් හා තෙයි ලෙස ය. (2) තෙයි, තෙයි, තා ලෙස ය.
(3) තිත්, තිත් තෙයි ලෙස ය. (4) තෙයියත් තා ලෙස ය.

09. "ලත් තැනින් කියත් බාසෙන්" යනු ................................ නැටුමේදී ගයන කවියකි.
(1) පතුරු (2) මෝල්ගස් (3) රබන් (4) කඩු

10. දම්වැලක පුරුක් මෙන් එකිනෙක හා සම්බන්ධව ප්‍රබන්ධිත වන්නම් වනුයේ,
(1) උඩරට වන්නම් ය. (2) පහතරට සිංදු වන්නම් ය.
(3) සබරගමු වන්නම් ය. (4) අධ්‍යතන වන්නම් ය.

11. අතීතයේ සබරගමු වන්නම් ..................... වාද ගී ස්වරූපයෙන් ඉදිරිපත් කර ඇත.

(1) සමන් දේවාලයේදී (2) මඩුවන්වෙල වලව්වේදී
(3) සංඛපාල විහාර පුදබිමේදී (4) දළදා පෙරහැරේදී

12. උඩරට, පහතරට, සබරගමු සම්ප්‍රදායන් තුනෙහි වන්නම් හි භාවිතා කරනු ලබන අංග ඇතුළත් වන්නේ,

(1) කස්තිරම, පදය (2) තානම, කවිය
(3) බෙර පදය, අඩව්ව (4) තාලරූපය, ඉරට්ටිය

13. කෝලම් රඟමඬල .......................... යනුවෙන් හැඳින්වේ.

(1) කමත (2) දේවාල භූමිය
(3) කරලිය (4) තානායම්පොළ

14. කෝලම් නාට්‍ය පසුබිම් වාදනය සඳහා යොදාගනු ලබන භාණ්ඩ වනුයේ,

(1) යක් බෙරය හා බුම්මැඩිය (2) පහතරට බෙරය හා හොරණෑව
(3) තාපම්පට හා තම්මැට්ටම (4) ගැටබෙරය හා සර්පිනාව

15. ගැමි නැටුම්වල දක්නට ලැබෙන මූලික ලක්ෂණ වේ.

(1) ඒකල රංගනය හා ගායනය (2) සාමූහික බව හා උපකරණ භාවිතය
(3) සංකීර්ණ පද හා සාමූහික බව (4) අනම්‍ය බව හා රංග වස්ත්‍රාභරණ භාවිතය

ප්‍රශ්න අංක 16 - 20 දක්වා ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට පහත වගුව භාවිත කරන්න.

| | A තීරය | B තීරය | C තීරය | D තීරය |
|---|---|---|---|---|
| 1 පේළිය | සිම්බල් | හක්ගෙඩිය | තම්මැට්ටම | මෘදංගය |
| 2 පේළිය | පන්තේරුව | බටනලාව | ගැටබෙරය | අඩු බෙරය |
| 3 පේළිය | තලිය | කොම්බුව | යක් බෙරය | රබාන |
| 4 පේළිය | තාලම්පට | හොරණෑව | දවුල | බුම්මැඩිය |

16. ඉහත වගුව අනුව දේශීය අවනද්ධ භාණ්ඩ පමණක් ඇතුළත් වන්නේ,

(1) A තීරයේ ය. (2) B තීරයේ ය. (3) C තීරයේ ය. (4) D තීරයේ ය.

17. ගැමි නැටුම්, නිර්මාණ නැටුම් සඳහා වාදනය කරනු ලබන සාම්ප්‍රදායික හා විකල්ප වාද්‍ය භාණ්ඩයක් ඇතුළත් වන්නේ,

(1) C තීරයේ 2 පේළියේ සහ D තීරයේ 2 පේළියේ ය.
(2) D තීරයේ 4 පේළියේ සහ D තීරයේ 1 පේළියේ ය.
(3) A තීරයේ 2 පේළියේ සහ A තීරයේ 3 පේළියේ ය.
(4) D තීරයේ 4 පේළියේ සහ D තීරයේ 2 පේළියේ ය.

18. පාසල් පෙරදිග තූර්යවාදන කණ්ඩායම් තුළ වාදනය කරනු දක්නට ලැබෙන වාද්‍ය භාණ්ඩ ඇතුළත් වී ඇත්තේ,

(1) B තීරයේ 4 පේළිය සහ D තීරයේ 1 පේළිය ය.
(2) D තීරයේ 1 පේළිය සහ A තීරයේ 4 පේළිය ය.
(3) D තීරයේ 4 පේළිය සහ A තීරයේ 4 පේළිය ය.
(4) C තීරයේ 1 පේළිය සහ A තීරයේ 2 පේළියේ ය.

19. හේවිසි වාදනය හා මළබෙර වාදනය වැනි අවස්ථාවලදී භාවිතා කරනු ලබන වාද්‍ය භාණ්ඩ වගුවෙන් තෝරා ලියා ඇති නිවැරදි පිළිතුර කුමක් ද?

(1) A සහ B තීරුවල ය. (2) A සහ D තීරුවල ය.
(3) B සහ D තීරුවල ය. (4) B සහ C තීරුවල ය.

20. විදේශීය අවනද්ධ භාණ්ඩයක් හා ආඝාතය තැබීම සඳහා යොදාගනු ලබන දේශීය තාල වාද්‍යය භාණ්ඩක් වන්නේ,

(1) D තීරයේ 1 පේළිය සහ B තීරයේ 3 පේළිය ය. (2) D තීරයේ 4 පේළිය සහ A තීරයේ 4 පේළිය ය.
(3) D තීරයේ 1 පේළිය සහ A තීරයේ 4 පේළිය ය. (4) C තීරයේ 1 පේළිය සහ A තීරයේ 1 පේළිය ය.

21. නර්තනයක ආහාර්ය අභිනය මනාලෙස පිළිබිඹු වන්නේ,

(1) අංග චලනවලිනි. (2) රංග වස්ත්‍රාභරණ වලිනි.
(3) භාව නිරූපණ අවස්ථා වලිනි. (4) ගායන හා වාදනවලිනි.

22. නාට්‍යමය පෙළපාලි බහුලව දක්නට ලැබෙන නර්තන සම්ප්‍රදාය ලෙස .................... දැක්විය හැක.

(1) පහතරට නර්තන සම්ප්‍රදාය ය. (2) උඩරට නර්තන සම්ප්‍රදාය ය.
(3) කථක් නර්තන සම්ප්‍රදාය ය. (4) සබරගමු නර්තන සම්ප්‍රදාය ය.

23. මුද්‍රා නාට්‍යයක ලක්ෂණයක් වන්නේ,

(1) සංගීතය අනුව නර්තනය මගින් කතා පුවත ඉදිරිපත් කිරීම.
(2) ගායනයට අනුව මුද්‍රා මගින් කතා පුවත ඉදිරිපත් කිරීම.
(3) සංවාද හා ගීත මගින් කතා පුවත ඉදිරිපත් කිරීම.
(4) ගායනය කරමින් කතා පුවත ඉදිරිපත් කිරීම.

24. නර්තනයේ මාධ්‍ය .................... ,

(1) රිද්මයයි. (2) තාලයයි. (3) චලනයයි. (4) නාදයයි.

25. නර්තනයෙහි යෙදෙන්නෙකු විසින් අවකාශය තුළ චලන හැසිරවීමේදී පරිශීලනය කරනු ලබන තල ගණන වන්නේ,

(1) 02 කි. (2) 03 කි. (3) 04 කි. (4) 01 කි.

26. නර්තන අවකාශය ප්‍රධාන කොටස් දෙකකි එනම්,

(1) පුද්ගල අවකාශය හා පොදු අවකාශය යි. (2) යුගල අවකාශය හා පොදු අවකාශය යි.
(3) පුද්ගල අවකාශය හා කණ්ඩායම් අවකාශය යි. (4) කේවල අවකාශය හා යුගල අවකාශය යි.

27. "තවද .................... නැන්දා මාමාගේ ගෙදර ගොස්, හොඳක් බතක් මාලුවක් කැවා වාගේ" — මෙය,

(1) නමස්කාර ගාථාවකි. (2) ටීකා සීපදයකි.
(3) ප්‍රශස්තියකි. (4) කඩතුරා කවියකි.

28. කරදිය මුද්‍රා නාට්‍යයෙහි එන සිසී සහ ඇගේ පෙම්වතාගේ චරිතය නිරූපණය කරන ලද්දේ,

(1) වජිරා සහ සේනවලවේ මහතා විසිනි (2) වජිරා සහ චිත්‍රසේන මහතා විසිනි
(3) වජිරා සහ රවිබන්දු මහතා විසිනි (4) වජිරා සහ විමල් නානායක්කාර මහතා විසිනි

29. පිළිවෙළින් චිත්‍රසේන ගුරින් හා පණීභාරත ගුරින් විසින් නිෂ්පාදනය කළ මුද්‍රා නාට්‍ය දෙකක් වන්නේ,

(1) කරදිය හා සැළලිහිනිය (2) පරවිය හා ග්‍රහ අපලය
(3) කරදිය හා ග්‍රහ අපලය (4) පරවිය හා දියවන්නාව

30. ශාන්තිකර්මවල දෙවියන් වෙනුවෙන් ගායන කරනු ලබන ගායන ................. නමින් හැඳින්වේ.

(1) මල් යහන් කවි (2) කඩතුරා කවි
(3) සෙත් කවි නමින් (4) සිරසපාද කවි

## II කොටස - උඩරට නර්තනය

31. ගැටබෙරයේ කොටස් වන්නේ,

(1) කැපුම් හම, වෙනිවර, සුරත් තට්ටුව (2) ඉල්ලම් මුදු, වෙනිවර, බෙර ඇස

(3) ගැටිය, වලයම, සුරත් තට්ටුව (4) වලයම, වෙනිවර, සුරත් තට්ටුව

32. දොං ජිංත ගත දොංත, මෙම බෙර පදය අයත් වන්නේ,

(1) මාත්‍රා 2 + 4 දෙතිතට (2) මාත්‍රා 2 + 3 දෙතිතට

(3) මාත්‍රා 3 + 4 දෙතිතට (4) මාත්‍රා 4 තනි තිත්ට

33. කොහොඹා කංකාරියේ දක්නට ලැබෙන සුවිශේෂ ගායන අවස්ථා වන්නේ,

(1) මඩුපුරය හා ආවැන්දුම (2) අයිලෙ යෙදීම හා මාත්‍රා පහ

(3) අස්නය හා මඩුපුරය (4) අයිලෙ යැදීම හා මහායාතිකාව

34. සිදුහත් කුමරු ගිහි ගෙයින් නික්මයාම පිළිබඳ අවස්ථාව විස්තර කෙරෙන වන්නම වන්නේ,

(1) තුරඟා වන්නම (2) සුරපති වන්නම (3) මහබෝ වන්නම (4) නෛයඩි වන්නම

- පහත දැක්වෙන රූප සටහන ඇසුරින් 35 සිට 37 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




35. තෝඩුපත්, කෙමෙත්ත හා ඉණ හැඩය දැක්වෙන්නේ,

(1) 1, 2, 3 අංකවලිනි (2) 1, 3, 2 අංකවලිනි (3) 2, 3, 1 අංකවලිනි (4) 1, 4, 2 අංකවලිනි

36. ඉහත 7, 6, 4 යන අංකවලින් දැක්වෙන්නේ,

(1) බුබුලු පටිය, හඟල, පායිම්පත (2) දෙවල්ල, හඟල, පායිම්පත

(3) සිලම්බු, පායිම්පත, දෙවල්ල (4) හඟල, උල්ලුඩය, අවුල්හැරය

37. ඉහත වස්ත්‍රාභරණ කට්ටලයේ හිස මුදුනට රිදී පාටින් නිමකළ ආභරණය හඳුන්වන්නේ,

(1) ජටාව නමිනි. (2) සිඛා බන්ධනය නමිනි.

(3) පායිම්පත නමිනි. (4) නෙත්තිමාලය නමිනි.

38. උඩරට සම්ප්‍රදායට පමණක් ආවේණික වචන වන්නේ,

(1) මණ්ඩිය, කලාසම, ඉරට්ටිය (2) පා සරඹ, අත්සරඹ, ඉරට්ටිය

(3) පා සරඹ, ගොඩ සරඹ, කස්තිරම (4) ගොඩ සරඹ, සීරුමාරුව, කස්තිරම

39. උඩරට නර්තන කලාව කෙරෙහි ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ අවධානයක් යොමුකර ගැනීමට සමත් වූ ශිල්පියෙකු වන්නේ,

(1) නිත්වෙල ගුණයා මහතා (2) එස්. එම්. සව්රිස් සිල්වා මහතා

(3) එන්. ඒ. සිරිබෝහාමි මහතා (4) එච්. එච්. ගෝමිස් මහතා

40. උඩරට නර්තනයේදී හා කෘෂි කර්මාන්තය හා බැඳි ගැමි නැටුම්වලදී භාවිත කරනු ලබයි.

(1) ගැට බෙරය හා බුම්මැඩිය (2) පොකුරු බෙරය හා දෙවොල් බෙරය

(3) ගැට බෙරය හා පනා බෙරය (4) දවුල හා පොකුරු බෙරය

## III කොටස - පහතරට නර්තනය

31. පහතරට බෙරයේ කොටස් වන්නේ,
(1) හැක්ම, කන්වරය, වෙනිවර (2) හැක්ම, හයිතට්ටුව, බෙරපුහුල
(3) හයිතට්ටුව, ඉල්ලම්, බෙර ලණුව (4) හැක්ම, වෙනිවවර, වලයම

32. ගුම් දෙගත ගත්ත ගුම් .... බෙර පදය,
(1) මාත්‍රා $2+4$ ට අයත් වේ. (2) මාත්‍රා $2+3$ ට අයත් වේ.
(3) මාත්‍රා $3+4$ ට අයත් වේ. (4) මාත්‍රා $4+4$ ට අයත් වේ.

33. දෙවොල් මඩුවේ දක්නට ලැබෙන සුවිශේෂී ගායන අවස්ථා දෙකක් වන්නේ,
(1) අයිලෙ යැදීම හා අස්නෙ (2) මල්යහන් කවි හා මහායාතිකාව
(3) බිසෝ කප උපත් කවි හා මහා යාතිකාව (4) මල්යහන් කවි හා තොරන්යාගයේ කවි

34. පත්තිනි දේවියගේ උපත පිළිබඳ කියවෙන නාට්‍යමය අවස්ථාවක් වන්නේ,
(1) අඹ විදමන (2) මරා ඉපැද්දවීම (3) ඇත් බන්ධනය (4) මිල්ල කැපීම

- ප්‍රශ්න 35 - 37 දක්වා පහත රූප සටහන ඇසුරින් පිළිතුරු සපයන්න.




35. තෙල් කච්චිය, ජටාව හා කකුල් පටි දැක්වෙන්නේ,
(1) 8, 1 හා 11 අංකවලිනි. (2) 8, 3 හා 11 අංකවලිනි.
(3) 9, 2 හා 1 අංකවලිනි. (4) 8, 1 හා 4 අංකවලිනි.

36. ඉහත වස්ත්‍රාභරණ කට්ටලයේ ඉනෙන් පහළ වැසෙන කොටස හඳුන්වනු ලබන්නේ,
(1) නලල් පටිය, ඉන පටිය, තෙල් කච්චිය (2) ඉණ හැඩය, කර පටිය, කකුල් පටිය
(3) කර තැල්ල, සේලය, පිජාමා කලිසම (4) ඉණ හැඩය, තෙල් කච්චිය, පිජාමා කලිසම

37. ඉහත රූප සටහනෙහි අංක 09 න් දැක්වෙන ආභරණය නම්,
(1) පබළු රැල්ලයි. (2) සිලම්බුවයි. (3) ගෙජ්ජි (4) පබළු කාප්පයයි.

38. පහතරට නර්තන සම්ප්‍රදායට පමණක් ආවේණික වචන වන්නේ,
(1) අඩව්ව, මාත්‍රා (2) රාග පද, අඹ විදමන (3) වන්නම්, අත්තාඩිය (4) ඉරට්ටිය, අත්තාඩිය

39. පහතරට නර්තනයේ ප්‍රවීන ශිල්පියෙකි.
(1) එස්. එච් සව්රිස් සිල්වා මහතා (2) එන්. ඒ. සිරිබෝහාමි මහතා
(3) තිත්තවෙල ගුණයා මහතා (4) ජේ. ඊ. සේදරමන් මහතා

40. පහතරට නර්තනයේදී හා කෘෂි කර්මාන්තය හා බැඳි නර්තන අංගවල භාවිත කරනු ලබන්නේ,
(1) දෙවොල් බෙරය හා බුම්මැඩිය (2) පොකුරු බෙරය හා දවුල
(3) උඩරට බෙරය හා පතාබෙරය (4) දවුල හා තම්මැට්ටම

## IV කොටස - සබරගමු නර්තනය

31. දවුලට අයත් කොටස් වන්නේ,

(1) ගැටිය, ඉල්ලම්, තට්ටුව (2) ගැටිය, මණ්ඩම, තට්ටුව

(3) ගැටිය, කඩිප්පුව, කයිපුඩි වළල්ල (4) ගැටිය, ලණුව, සුරත් තට්ටුව

32. ජිං ජිමිත තක් තකිට, මෙම දවුල් පදය අයත් වන්නේ,

(1) මාත්‍රා $2+4$ දෙතිතට (2) මාත්‍රා $2+3$ දෙතිතට

(3) මාත්‍රා $3+4$ දෙතිතට (4) මාත්‍රා 4 තනි තිතට

33. පහන් මඩුවේ දක්නට ලැබෙන සුවිශේෂ ගායන අවස්ථා දෙකක් වන්නේ,

(1) අයිලෙ යැදීම හා මඩුපුරය (2) මල් යහන් කවි හා මාත්‍රා පද

(3) බිසෝ කප උපත් කවි හා දාන පහ (4) මල් යහන් කවි හා තොරණ්යාගයේ කවි

34. පත්තිනි දෙවි උපත ගැන කියවෙන නාට්‍යමය ලක්ෂණ අන්තර්ගත අංගයක් වන්නේ,

(1) අඹවිදමන (2) දෙවොල් ගොඩබැසීම

(3) අසුර යක්කම (4) රාමා යක්කම

• **35 සිට 37 දක්වා ප්‍රශ්නවලට රූප සටහන ඇසුරින් පිළිතුරු සපයන්න.**




35. හැඩ කැල්ල, සේලය හා කඩුක්කන් දැක්වෙන්නේ,

(1) 7, 2, 3 අංගවලිනි. (2) 7, 2, 4 අංගවලිනි. (3) 5, 2, 4 අංගවලිනි. (4) 2, 6, 3 අංගවලිනි.

36. ඉහත 3, 4, 5 අංගවලින් දැක්වෙන්නේ,

(1) බන්දි වළලු, ජටාව, සේලය (2) කඩුක්කන්, හස්ත කඩය

(3) බන්දි වළලු, ගිගිරි, සිලම්බු (4) කඩුක්කන්, බන්දි වළලු, හස්ත කඩය

37. ඉහත වස්ත්‍රාභරණ කට්ටලයේ ඉනෙන් පහළ කොටස ආවරණය වන්නේ අඳිනු ලබන රෙද්ද හඳුන්වනු ලබන්නේ,

(1) හස්තකඩය නමිනි. (2) ජටාව නමිනි. (3) සේලය නමිනි. (4) ඉණපටිය නමිනි.

38. සබරගමු නර්තන සම්ප්‍රදායට ආවේණික වචන වන්නේ,

(1) අස්නෙ, රාමා මැරීම, අසුර යක්කම (2) අස්නෙ, ඇත් බන්ධනය

(3) කලාසම, සීරුමාරුව, මුදුන්තාලය (4) කලාසම, දේවකෝල්පාඩුව, මුදුන්තාලය

39. උගතුන්ගේ අවධානයෙහි සබරගමු නර්තනය බැහැරව තිබූ අවධියක ඒ කෙරෙහි ඔවුන්ගේ අවධානය යොමු කරවීමට සමත් ශිල්පියෙකු වූයේ,

(1) එන්. ඒ. සිරිබෝහාමි මහතා (2) එම්. එච්. ගෝමිස් මහතා

(3) එස්. එච් සව්රිස් සිල්වා මහතා (4) නිත්තවෙල ගුණයා මහතා

40. සබරගමු නර්තනයේදී හා කෘෂි කර්මාන්තය හා බැඳි නර්තනයේදී භාවිතා කෙරේ.

(1) දවුල හා බුම්මැඩිය (2) දවුල හා තම්මැට්ටම (3) දවුල හා දඬුබෙරය (4) දවුල හා අත්මිණිය

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

පළමු වාර පරීක්ෂණය 2019 මාර්තු
First Term Test, March 2019

11 ශ්‍රේණිය
Grade 11

නර්තනය - II

පැය දෙකයි
Two hours

සැලකිය යුතුයි :
- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

---

(01) සියලු ම ප්‍රශ්නවලට සුදුසු පිළිතුරු ඔබගේ පිළිතුරු පත්‍රයේ අදාල ප්‍රශ්න අංකය යොදා ඉදිරියෙන් ලියන්න.

i. දෙතිතේ ප්‍රභේද සංඛ්‍යාව ................................................................ කි.

ii. රබන් පද වාදනය සඳහා ................................................................ රබාන යොදාගනී.

iii. උඩරට වන්නම් රචනා වූයේ ................................................................ යුගයේදී යැයි සැලකේ.

iv. විශ්ම නම් වූ ස්ථායිභාවය මුල්කොටගෙන ................................................................ රසය උපදී.

v. "සොබමන් දෙවිවරු සදෙනෙක් එතනට" යනු ................................................................ නැටුමේ කවියකි.

vi. ක්‍රි. ව. 2වන සියවසේදී පමණ ................................................................ විසින් නාට්‍ය ශාස්ත්‍රය නම් කෘතිය රචනා කරන ලද බව කියවේ.

vii. දළදා කරඬුව මාලිගාව තුළට වැඩම කරවීමේදී ................................................................ හේවිසි වාදනය සිදුකරනු ලැබේ.

viii. ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ලද ප්‍රථම මුද්‍රා නාට්‍යය කුමක් ද?

ix. දේශීය නර්තන කලාවේ ප්‍රවර්ධනය සඳහා සුවිශේෂී කාර්යයන් ඉටුකළ ලාංකීය නර්තන ශිල්පිනියන් දෙදෙනෙක් නම් කරන්න.

x. පහත සඳහන් චරිත ඇතුළත්වන මුද්‍රානාට්‍ය හා එය නිර්මාණය කරන ලද කලාකරුවා නම් කරන්න.
A. සිසී ................................................ B. කලාකරුවා ................................................

02. (i) මාත්‍රා 2 + 2 + 3 තුන් තිතට අයත් බෙර පදයක් ලියන්න. (ල. 04)

(ii) මාත්‍රා 4 + 4 තාල රූපයට අයත් වන්නමක/ සින්දු වන්නමක කවියක් ප්‍රස්තාරගත කරන්න. (ල. 04)

(iii) ඔබ උගත් ඕනෑම දෙතිතේ තාලරූපයට අයත් කස්තිරමක් / ඉරට්ටියක් ප්‍රස්තාරගත කරන්න. (ල. 04)

03. දේශීය නර්තන සම්ප්‍රදායන් ත්‍රිත්වයට අදාළ ප්‍රධාන ශාන්තිකර්ම හා සෙසු ශාන්තිකර්ම රැසක් දක්නට ලැබේ.

(i) දේශීය නර්තන සම්ප්‍රදායන් හා බැඳි ප්‍රධාන ශාන්තිකර්ම 3 නම් කරන්න. (ල. 03)

(ii) ඔබ ඉගෙනගන්නා නර්තන සම්ප්‍රදායට අයත් ප්‍රධාන ශාන්තිකර්මයේ ඇතුළත් නර්තන අංග 02ක් කෙටියෙන් විස්තර කරන්න. (ල 04)

(iii) ශාන්තිකර්මවල රංගභූමි සැරසිලි අංග 03 පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න. (ල. 05)

04 පහත සඳහන් මාතෘකා අතුරින් තුනක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) සතර අභිනය (ii) කවාඩි නර්තනය

(iii) වන්නම් (iv) ශාන්තිකර්ම ආශ්‍රිත ගායන

(v) ගැමි නැටුම්

05 දේශීය මෙන්ම විදේශීය නර්තන කලාවන් පිළිබඳ අධ්‍යනය තුළින් අපට විවිධ සංස්කෘතිකාංග පිළිබඳ අවබෝධයක් ලැබේ.





(i) ඉහත රූප සටහන්වලින් දක්වෙන නර්තන සම්ප්‍රදාය හා ප්‍රචලිත ප්‍රදේශයක් නම් කරන්න. (ල. 02)

(ii) එම නර්තන සම්ප්‍රදායේ වේශ නිරූපණ ක්‍රම දෙකක් පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ල. 04)

(iii) එම නර්තන සම්ප්‍රදායට අදාළව,

A වාද්‍ය භාණ්ඩ දෙකක්

B සංගීත සම්ප්‍රදාය

C නර්තන අංග දෙකක් නම් කරන්න.

06 (i) නර්තන කලාවේ ඉතිහාසය පිළිබඳව තොරතුරු ලබාගත හැකි මූලාශ්‍ර දෙකක් නම් කරන්න. (ල. 02)

(ii) අනුරාධපුර යුගයේ නර්තන කලාවට රාජ්‍ය අනුග්‍රහය ලැබුණු බවට සාධක දෙකක් ඉදිරිපත් කරන්න. (ල. 04)

(iii) දේශීය නර්තන කලාවේ සාධක හමුවන වැදගත් ස්ථාන රැකගැනීම සඳහා නර්තන කලාව හදාරන්නෙකු ලෙස ඔබට අනුගමනය කල හැකි පියවර තුනක් යෝජනා කරන්න. (ල. 06)

07. වර්ෂ අවසාන පාසල් විවිධප්‍රසංගයේ රංගවස්ත්‍රාභරණ නිර්මාණය සහ අංග රචනය ඔබ වෙත පැවරේ.

(i) අංග රචනා ශිල්පියෙකු ලෙස ඔබ ලඟ සූදානම් කරගත යුතු ද්‍රව්‍ය/ උපකරණ ලැයිස්තුවක් සකස් කරන්න. (ල. 03)

(ii) එහි එක් නර්තන අංගයක් සඳහා රංග වස්ත්‍රාභරණ කට්ටලයක් සකස් කරගන්නා ආකාරය පැහැදිලි කරන්න. (ල. 04)

(iii) නර්තන කලාවේ නව ප්‍රවණතා පිළිබඳව පුවත්පතකට ලිපියක් සකස් කරන්න. (ල. 05)